**"අභ්‍යාසලාභී උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන" යටතේ බඳවා ගත් උපාධිධාරීන් හා ඩිප්ලෝමාධාරීන්**

**ඌව පළාත් සභාවට අයත් සිංහල හා දෙමළ මාධ්‍ය පාසල්වල පවතින ගුරු**

**ගුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම - 2022**

ඌව පළාත් සභාවේ සිංහල හා දෙමළ මාධ්‍ය පාසල්වල පහත සඳහන් විෂයයන්වල පවතින ගුරු පුරප්පාඩු පිරවීම සඳහා අංක 21/2076/315/033-I හා 2021.12.13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය හා රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ED/02/29/21/A1/01/2020 හා 2021.12.31 දිනැති ලිපියේ උපදෙස් ප්‍රකාරව, මෙම නිවේදනයේ අංක 02 යටතේ දක්වා ඇති කාණ්ඩවලට අයත් උපාධිධාරීන්ගෙන් හා ඩිප්ලෝමාධාරීන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2022.08.22 දින වේ.

පුරප්පාඩු විෂය ලේඛනය

| අ.අ | විෂය | විෂය ක්ෂේත්‍ර අංකය | සිංහල මාධ්‍ය පුරප්පාඩු | දෙමළ මාධ්‍ය පුරප්පාඩු |
|---|---|---|---|---|
| **06- 11 ශ්‍රේණිය දක්වා පුරප්පාඩු විෂයන්** | | | | |
| 1 | බුද්ධ ධර්මය | 1 | 13 | - |
| 2 | සිංහල | 2 | 43 | - |
| 3 | විද්‍යාව | 3 | 49 | 05 |
| 4 | ගණිතය | 4 | 56 | 22 |
| 5 | භූගෝල විද්‍යාව | 5 | 56 | 15 |
| 6 | කෘෂි ආහාර තාක්ෂණය | 6 | 46 | 14 |
| 7 | චිත්‍ර | 7 | 90 | 13 |
| 8 | නැටුම් | 8 | 29 | 16 |
| 9 | සංගීතය | 9 | 27 | 16 |
| 10 | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | 10 | 108 | 28 |
| 11 | ඉතිහාසය/දේශපාලන විද්‍යාව | 11 | 42 | 12 |
| 12 | ව්‍යාපාර හා ගිණුම්කරණය | 12 | 39 | 12 |
| 13 | නාට්‍ය හා රංග කලාව | 13 | 06 | - |
| 14 | හින්දු ධර්මය | 14 | - | 08 |
| 15 | ඉස්ලාම් | 15 | - | 03 |
| 16 | ක්‍රිස්තියානි | 16 | - | 01 |
| 17 | දෙමළ භාෂාව | 17 | - | 06 |

01. **බඳවා ගැනීමේ පොදු සුදුසුකම් :-**

1.1 අයදුම්කරු /අයදුම්කාරිය පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය.

1.2 යහපත් චරිතයකින් හා මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

1.3 2019.12.31 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුය.

02. **අයදුම් කළ හැකි කාණ්ඩයන් :-**

**ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු හා ඌව පළාත තුළ මධ්‍යම රජයේ ආයතනවල සේවයේ නියුතු,**

1.1 "උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන" 2020 හා 2021 යටතේ බඳවා ගනු ලැබූ සියළුම උපාධිධාරීන් හා ඩිප්ලෝමාධාරීන්.

1.2 2018 සහ 2019 වර්ෂවල ක්‍රියාත්මක කළ "අභ්‍යාසලාභී උපාධිධාරීන් හට රජයේ ආයතනවල පුහුණුවක් ලබා දීම" වැඩසටහන යටතේ උපාධිධාරී/ඩිප්ලෝමාධාරී අභ්‍යාසලාභීන් ලෙස පුහුණුවට බඳවා ගනු ලැබ 2020.01.01 සහ 2021.01.01 දින සිට සංවර්ධන නිලධාරී සේවයේ ස්ථිර පත්වීම් ලැබූ කණ්ඩායම.

1.3 උක්ත කාණ්ඩවලට අයත් ස්ථිර පත්වීම් ලැබූ භික්ෂූන් වහන්සේලා.
(භික්ෂූන් වහන්සේලා ගුරු සේවයට පත් කිරීමේ දී, අංක 19/විවිධ(66) සහ 2019.12.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය හා රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ED/02/29/11/07/04 (තාව) හා 2020.02.19 දිනැති ලිපියේ උපදෙස් ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.)

03. **අධ්‍යාපන සුදුසුකම් :-**

3.1 අංක 1885/38 හා 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ සටහන 6 වගන්තිය ප්‍රකාරව අයදුම් කරනු ලබන සෑම අයදුම්කරුවෙකුම අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව විෂයක් වශයෙන් සමත් වීම.

3.2 ඉගැන්වීම් කාර්යයන් සඳහා පිළිගත් සුවිශේෂ කරන ලද ක්ෂේත්‍රවලට අයත්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් (දේශීය/විදේශීය) විශ්ව විද්‍යාලයක් මගින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් මගින් හෝ පිරිනමනු ලබන උපාධියක්/ඩිප්ලෝමාවක් ලබා තිබිය යුතු අතර, එම උපාධියට/ඩිප්ලෝමාවට හදාරා ඇති ප්‍රධාන විෂයයන් වලට අනුකූලව එක් එක් විෂය සඳහා සුදුසුකම් සපුරා තිබීම අනිවාර්ය වේ.

**(සැලකිය යුතුයි :- අයදුම් කරනු ලබන සෑම උපාධිධාරියෙකුම/ඩිප්ලෝමාධාරියෙකුම අංක 17/1597/742/027 හා 2017.08.29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ඉගැන්වීමට නියමිත විෂය, උපාධියට හදාරනු ලැබූ මුළු විෂය සංධරයෙන් තුනෙන් එකක් (1/3) සම්පූර්ණ කළ අයවළුන් පමණක් විය යුතුය.)**

04. **සේවා කොන්දේසි :-**

4.1 මෙම තනතුර ස්ථිරය. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.

4.2 මුලින් පත් කරන පාසලේ වසර 05 ක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතු අතර, කිසිදු හේතුවක් මත ස්ථාන මාරුවීම් හෝ අනුයුක්ත කිරීම් සඳහා කෙරෙන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

4.3 වසර 05 ක සේවා කාලයකට පසු ඌව පළාත් ගුරු මාරු ප්‍රතිපත්තිය අනුව සේවා අවශ්‍යතාවය මත ඌව පළාතේ වෙනත් පාසලකට ස්ථාන මාරුවීම් ලබා දීමට ඌව පළාත් සභා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සලකා බලනු ඇත.

4.4 රජයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අංක 1885/38 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන සංශෝධනවලට ද යටත් වේ.

4.5 අභ්‍යාසලාභී උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන යටතේ බඳවා ගන්නා ලද උපාධිධාරීන්/ඩිප්ලෝමාධාරීන් ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 - I (අ) ශ්‍රේණියට බඳවා ගනු ලබන අතර, **2022.01.05** දිනැති **03/2016(iv)** හි **GE-1-2016 -** ඒ වැටුප් බණ්ඩය යටතේ මාසිකව රු.**31,490/-445x6-525x7- 600x2-39,035/-** මාසික වැටුප් පරිමාණයේ 14 වන වැටුප් පියවරෙහි පිහිටුවනු ලැබේ.

05. **බඳවා ගැනීමේ ක්‍රමය :-**

5.1 අයදුම්පත් ඉදිරිපත් කරන ලද සියළුම අයදුම්කරුවන් උදෙසා ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් ලිඛිත තරඟ විභාගයක් පවත්වනු ලැබේ. නමුත් එක් එක් විෂය සඳහා ඇබෑර්තු ප්‍රමාණය හා ලැබෙන අයදුම්පත් ප්‍රමාණය අනුව විභාගයට ඉදිරිපත් කිරීමේ හෝ නොකිරීමේ තීරණය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. ලිඛිත තරඟ විභාගයෙන් සමත් වන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට හා ඉගැන්වීමේ හැකියාව මැන බැලීම සඳහා පැවැත්වෙන ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කර ලිඛිත තරඟ විභාගයේ හා ප්‍රායෝගික පරීක්ෂණයේ ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පාසල් පාදකව සුදුස්සන් තෝරා ගැනීමට කටයුතු කරනු ලැබේ.

5.2 ලිඛිත තරඟ විභාගයෙන් සමත් වන අයදුම්කරුවන් ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පවත්වන සම්මුඛ පරීක්ෂණයකට හා ඉගැන්වීමේ හැකියාව මැන බැලීම සඳහා පැවැත්වෙන ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කර ලිඛිත තරඟ විභාගයේ හා ප්‍රායෝගික පරීක්ෂණයේ ලකුණුවල එකතුවෙහි කුසලතා අනුපිළිවෙල අනුව පාසල් පාදකව සුදුස්සන් තෝරා ගැනීමට කටයුතු කරනු ලැබේ.

5.3 ලිඛිත තරඟ විභාගයෙන් සමත් අයදුම්කරුවෙකු වෙත පාසල් පාදක ක්‍රමය යටතේ පාසලක් නොලැබුණහොත් ලිඛිත විභාගයෙන් හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණුවල එකතුවෙහි කුසලතා අනුපිළිවෙල අනුව, පාසල් පාදක ක්‍රමය යටතේ කිසිදු අයදුම්කරුවෙකු අයදුම් නොකළ පුරප්පාඩු පාසලක් ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දෙනු ලැබේ.

5.4 උක්ත 5.3 හි සඳහන් පරිදි පුරප්පාඩු පාසලක් ලබා දීමේ දී කුසලතාවය සමාන වන අයදුම්කරුවන් සිටී නම්, විශේෂ උපාධියක් ඇති අයදුම්කරුවන් වෙත ප්‍රමුඛස්ථානය ලබා දෙනු ලැබේ.

5.5 **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :**

ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් නිවේදනයේ හෝ පුවත්පත් දැන්වීමේ හෝ වෙබ් අඩවියේ දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික හා මානසික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සිදු කෙරේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

5.6 ප්‍රායෝගික පරීක්ෂණය :

ගුරු වෘත්තියේදී වැදගත් වන ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අයදුම්කරු සතු කුසලතාවය මැන බැලේ. ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් නිර්ණායක පදනම් කොට ගෙන මේ සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.

5.7 එමෙන්ම මෙම ගැසට් නිවේදනයෙන් ආවරණය නොවන යම් කරුණක් වෙතොත් එම අවස්ථා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විධිවිධානවලට යටත්වනු ඇත.

06. අයදුම් කළ යුතු පිළිවෙල :-

6.1 මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කර ගත යුතුය. අයදුම්පතේ ඒ ඒ ශීර්ෂයන් ලබා දී ඇති උපදෙස් අනුගමනය කරමින් පැහැදිලිව තම අත් අකුරෙන්ම සම්පූර්ණ කළ යුතුය. අංක 01 සිට 07 දක්වා කොටස් පළමු පිටුවට ද ඉතිරිය දෙවන පිටුවට ද ඇතුළත් වන සේ අයදුම්පත සැකසිය යුතුය.

6.2 සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2022.08.22** දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "ලේකම්, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 14/4, පිලිපොතගම පාර, පිංඅරාව, බදුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්පත් බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"අභ්‍යාසලාභී උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන යටතේ ගුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම"** යනුවෙන් සහ ඔබ අයදුම් කරන විෂය හා විෂය අංකය පැහැදිලිව සටහන් කළ යුතුය.

6.3 ඌව පළාත් රාජ්‍ය සේවයේ නියුතු හා ඌව පළාත තුළ මධ්‍යම රජයේ ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන්, අයදුම්පත තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

6.4 අයදුම්කරුවකුට එක් විෂයක් සඳහා පමණක් ඉල්ලුම් කළ හැකි අතර, අයදුම් කරනු ලබන විෂය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. ඒ පිළිබඳව ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳව සලකා බලනු නොලැබේ. උපලේඛන අංක 01 අනුව අයදුම් කරනු ලබන විෂය හා විෂය අංකය, අයදුම්පතේ අදාළ ස්ථානයේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

6.5 අයදුම්කරුවකුට පාසල් 03 ක් සඳහා ඉල්ලුම් කළ හැකි අතර, අයදුම් කරනු ලබන පාසල් පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. ඒ පිළිබඳව ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳව සලකා බලනු නොලැබේ. www.psc.up.gov.lk වෙබ් අඩවියෙහි දක්වා ඇති උපලේඛන අංක 01 පාසල් පුරප්පාඩු ලේඛනය අනුව අයදුම් කරනු ලබන පාසලේ අනුක්‍රමික අංකය, කලාපය හා පාසලේ නම, අයදුම්පතේ අදාළ ස්ථානයේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

6.6 එක් අපේක්ෂකයකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි. අයදුම්පත් කැඳවන අවස්ථාවේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවා ගනු ලබන අතර, ඌව පළාතේ පවතින ඕනෑම පාසලක සේවය කිරීම සඳහා අයදුම්කරු එකඟ විය යුතු වේ.

6.7 නියමිත ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන, විභාග හා පරිපාලන ගාස්තු ගෙවා නොමැති අයදුම්පත්, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් සහ නියමිත සුදුසුකම් නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍ර වෙබ් අඩවියෙහි දැක්වෙන ආකෘති පත්‍රයට අනුකූලවම ඉදිරිපත් කිරීම අපේක්ෂකයන්ගේ වගකීමකි. අයදුම්පත තැපෑලේදී නැති වීම හා ප්‍රමාද වීම පිළිබඳව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. ඉදිරිපත් කරන අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

6.8 අත්සන සහතික කිරීම :-

අයදුම්පතේ අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු/කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු /ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු/පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු/ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරණ රු. 47,615/- ක් හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

07. විභාග හා පරිපාලන ගාස්තු :

විභාග ගාස්තු හා පරිපාලන වියදම් රු.1250/- කි. මෙම මුදල _ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20.03.02.13 ට බැර වන පරිදි ඌව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වෙත_ මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබාගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. ඉදිරි ප්‍රයෝජනය සඳහා එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම වැදගත් වේ. ඌව පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබාගත් ලදුපත් හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබා ගත් ලදුපත් හෝ මුදල් ඇණවුම් හෝ මුද්දර හෝ භාරගනු නොලබන අතර, එම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

08. විභාග පටිපාටිය සහ තරඟ විභාගයේ විෂය නිර්දේශය :-

8.1 ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් ඒ පිළිබඳව ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. එසේ විමසීමේ දී ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ලඟ තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත / අයදුම්පත් තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

8.2 තරග විභාගය බදුල්ල හා මොණරාගල නගර වලදී පමණක් පැවැත්වෙනු ඇත.

8.3 නියමිත විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

8.4 විභාග දිනයේ දී අපේක්ෂකයාගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත, වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම ලියවිලි හැර වෙනත් කිසිදු ලියවිල්ලක් පිළිගනු නොලැබේ.

8.5 තරග විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පතක් නිකුත් කිරීම, අයදුම්කරු අදාළ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුවහොත් එම අයදුම්කරු පත්වීම් ලබා දීම සඳහා නුසුදුස්සකු ලෙස සලකනු ලැබේ.

8.6 මෙම තරග විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අපේක්ෂකයකු මුළු විභාගය සඳහාම පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකිනි. අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු භාෂා මාධ්‍යය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

8.7 ලිඛිත තරග විභාගය බහුවරණ හා කෙටි පිළිතුරුවලින් සමන්විත පහත ප්‍රශ්න පත්‍ර 02 කින් යුක්ත වේ. සෑම අපේක්ෂකයෙකුම ප්‍රශ්න පත්‍ර දෙක (02) සඳහාම පෙනී සිටිය යුතුය.

01. අභියෝග්‍යතාව - කාලය පැය 01 - ලකුණු 100

අපේක්ෂකයා සතු ගුරු වෘත්තිය සඳහා වන කුසලතා, තර්කානුකූල බුද්ධිය පිළිබඳ දැනුම මැන බැලීම අරමුණු කොට ගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකසනු ලැබේ. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විතය. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

02. සාමාන්‍ය දැනීම - කාලය පැය 01 - ලකුණු 100

ගුරු ක්ෂේත්‍රය පිළිබඳව ඇති සාමාන්‍ය දැනුම, දේශීය වශයෙන් සිදු වී ඇති හා සිදුවන අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනුම හා අධ්‍යාපන නවීකරණය පිළිබඳව සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

තරග විභාගය සමත් වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා අවම වශයෙන් ලකුණු 40% ක් හෝ ඊට ඉහළ ලකුණු ලබා ගත යුතුය.

8.8 ප්‍රායෝගික පරීක්ෂණය : කාලය - විනාඩි 5 කට නොඅඩු කාලයක් ලබා දෙනු ලැබේ.
- උපරිම ලකුණු 25

අයදුම්කරු විසින් පත්වීම් ලබා ගැනීමට අපේක්ෂා කරන විෂයයට අදාළව හඳුනාගන්නා ලද මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතුය. මේ සඳහා පහත සඳහන් නිර්ණායකයන් ඔස්සේ ලකුණු හිමි වේ. මෙම පරීක්ෂණය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ.

| අනු අංකය | ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක | නිර්ණායකයන්හි අරමුණ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | අරමුණ හා ප්‍රවිෂ්ඨ වීම | සාර්ථකව පාඩමෙහි අරමුණ පැහැදිලි කිරීම හා පාඩමට ප්‍රවිෂ්ඨ වීමේ හැකියාව ඇගයීම. | 05 | 02 |
| 02 | පෞරුෂය හා හඬ පාලනය | ගුරුවරයකු ලෙස මනා පෞරුෂයකින් යුතු වීම හා ඉගැන්වීමේ දී මනා ලෙස හඬ පාලනය කිරීමේ ඇති හැකියාව ඇගයීම. | 05 | 02 |
| 03 | සන්නිවේදනයේ පැහැදිලි බව | ඉගෙනුම් /ඉගැන්වීම් ක්‍රියාවලියේදී අදාළ කරුණු ඵලදායි ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම. | 05 | 02 |
| 04 | කාල කළමනාකරණය | ලබා දෙනු ලබන කාලසීමාව තුළ අරමුණ කෙරෙහි ළඟා වීමේ කුසලතාව ඇගයීම. | 05 | 02 |
| 05 | ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය | අරමුණ කෙරෙහි ළඟා වීම සඳහා ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම මනා ලෙස භාවිතා කිරීමේ හැකියාව ඇගයීම. | 05 | 02 |
| | මුළු ලකුණු ප්‍රමාණය | | 25 | 10 |

- ප්‍රායෝගික පරීක්ෂණය සමත්වීම සඳහා එක් එක් නිර්ණායක සඳහා අවම වශයෙන් ලකුණු 2 බැගින් ලබා ගත යුතුය.

09. සම්මුඛ පරීක්ෂණ සඳහා නියමිත දිනයේදී සහභාගී නොවන අයදුම්කරුවන් පිළිබඳව කිසිදු අයුරකින් නැවත සලකා බලනු නොලැබේ.

10. එමෙන්ම සම්මුඛ පරීක්ෂණ දිනයට සියලු සහතික ඉදිරිපත් කළ යුතු අතර, පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු සහතිකයක් භාර ගනු නොලැබේ.

11. **සාවද්‍ය තොරතුරු සැපයීම :-**

මෙම විභාගයට ඉදිරිපත් වීම සඳහා කිසියම් අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුව ද අපේක්ෂකයකු ඉදිරිපත් කළ යම් තොරතුරක් සාවද්‍ය බව හෝ දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

12. මෙම තනතුරු සඳහා බඳවා ගැනීම සිදු කිරීම/නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාවෙන් කොටසක් සම්පූර්ණ කිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව හෝ මේ සම්බන්ධයෙන් වන කුමන හෝ කරුණක් පිළිබඳව අවසාන තීරණය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම් / තීරණය කිරීම ඌව පළාත් ආණ්ඩුකාරවරයාගේ උපදෙස් මත ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් සිදු කරනු ඇත.

13. සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

2022.08.01 වන දින.
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 14/4, පිළිපොතගම පාර,
පිං අරාව, බදුල්ල.

(ගාමිණී මහින්දපාල ජෝපියස්)
ලේකම්
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

# සිංහල මාධ්‍ය ගුරු පුරප්පාඩු - **2022** - සාරාංශය

| අ/අ | කලාපයේ නම | විද්‍යාව | ගණිතය | භූගෝල විද්‍යාව | කෘෂි ආහාර තාක්ෂණ | බුද්ධධර්මය | චිත්‍ර | නැටුම් | සංගීතය | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | ඉතිහාසය / දේශපාලන විද්‍යාව | ව්‍යාපාර හා ගිණුම්කරණය | සිංහල | නාට්‍ය හා රංගකලාව | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | බදුල්ල | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 2 | බණ්ඩාරවෙල | 2 | 1 | 0 | 2 | 1 | 0 | 2 | 0 | 3 | 2 | 1 | 6 | 0 | **20** |
| 3 | වැලිමඩ | 3 | 5 | 3 | 1 | 3 | 12 | 6 | 1 | 22 | 7 | 8 | 3 | 0 | **74** |
| 4 | පස්සර | 6 | 8 | 9 | 4 | 0 | 12 | 7 | 10 | 8 | 8 | 10 | 3 | 3 | **88** |
| 5 | වියළුව | 4 | 8 | 8 | 4 | 1 | 11 | 3 | 1 | 6 | 16 | 8 | 12 | 0 | **82** |
| 6 | මහියංගණය | 9 | 11 | 4 | 20 | 1 | 10 | 4 | 8 | 10 | 0 | 1 | 2 | 2 | **82** |
| 7 | බිබිල | 4 | 4 | 13 | 5 | 1 | 22 | 0 | 1 | 21 | 5 | 1 | 6 | 0 | **83** |
| 8 | මොණරාගල | 11 | 12 | 10 | 5 | 0 | 15 | 4 | 2 | 23 | 0 | 9 | 4 | 0 | **95** |
| 9 | වැල්ලවාය | 6 | 2 | 5 | 1 | 3 | 5 | 0 | 1 | 12 | 0 | 0 | 0 | 1 | **35** |
| 10 | තණමල්විල | 4 | 5 | 4 | 4 | 3 | 3 | 3 | 3 | 3 | 4 | 1 | 7 | 0 | **44** |
| එකතුව | | **49** | **56** | **56** | **46** | **13** | **90** | **29** | **27** | **108** | **42** | **39** | **43** | **6** | **604** |

# සිංහල මාධ්‍ය ගුරු පුරප්පාඩු - බණ්ඩාරවෙල අධ්‍යාපන කලාපය

| අනු අංකය | පාසල | විද්‍යාව | ගණිතය | කෘෂි ආහාර තාක්ෂණය | බුද්ධ ධර්මය | නැටුම් | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | ඉතිහාසය /දේශපාලන විද්‍යාව | ව්‍යාපාර හා ගිණුම්කරණය | සිංහල භාෂාව හා සාහිත්‍යය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | බ/ලියන්ගහවෙල මහා විදුහල | 1 | | 1 | | 1 | | 1 | | | **4** |
| 2 | බ/කොළොන්ගස්තැන්න විදුහල | | | | | | 1 | | | 2 | **3** |
| 3 | බ/වෙලන්හින්න විදුහල | | | | | | | | | 1 | **1** |
| 4 | බ/හිවැල්කදුර මහා විදුහල | | | | | 1 | 1 | | 1 | 1 | **4** |
| 5 | බ/ශ්‍රී සගත මහා විදුහල | 1 | 1 | 1 | | | 1 | 1 | | 1 | **6** |
| 6 | බ/කල්/ඉළුක්පැලැස්ස විදුහල | | | | 1 | | | | | 1 | **2** |
| **එකතුව** | | **2** | **1** | **2** | **1** | **2** | **3** | **2** | **1** | **6** | **20** |

# සිංහල මාධ්‍ය ගුරු පුරප්පාඩු - බිබිල අධ්‍යාපන කලාපය

| අනු අංකය | පාසල | විද්‍යාව | ගණිතය | භූගෝල විද්‍යාව | කෘෂි හා ආහාර තාක්ෂණය | බුද්ධාගම | චිත්‍ර | සංගීතය | තොරතුරු තාක්ෂණය | ඉතිහාසය/ දේශපාලන විද්‍යාව | ව්‍යාපාර හා ගිණුම්කරණය | සිංහල | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | මො/මහාමාත්‍ය ම.වි. | 1 | 1 | | | | | | | | | 1 | **3** |
| 2 | මො/පිටකුඹුර ම.වි. | | | | | | 1 | | | | | 1 | **2** |
| 3 | මො/සිරිධම්මපාල ක.වි. | | | | | | | | 1 | | | | **1** |
| 4 | මො/රදළියද්ද ක.වි. | | | | | | | | 1 | 1 | | | **2** |
| 5 | මො/නාගල පියරතන ක.වි. | | | 1 | | | 1 | | 1 | | | | **3** |
| 6 | මො/වැගම ක.වි. | | | 1 | | | | | | | | | **1** |
| 7 | මො/බුළුපිටිය ක.වි. | | | 1 | | | | | | | | | **1** |
| 8 | මො/බදුල්ලගම්මන ක.වි. | | | | | | 1 | | 1 | | | | **2** |
| 9 | මො/මූදියල ක.වි. | | | 1 | | | 1 | | | | | | **2** |
| 10 | මො/හැපොල ක.වි. | | | 1 | | | 1 | | 1 | | | | **3** |
| 11 | මො/කරගහවෙල ක.වි. | | | | | | 1 | | 1 | | | | **2** |
| 12 | මො/ඇතුන්දැමුවාව ක.වි. | | | | | | | | 1 | | | | **1** |
| 13 | මො/කණවේගල්ල ක.වි. | | | 1 | | | | | 1 | | | | **2** |
| 14 | මො/ඌරාවුල ප්‍රා.වි. | | | | 1 | | | | | | | | **1** |
| 15 | මො/නන්නපුරාව ම.වි | | 1 | | | | 1 | | | | | 1 | **3** |
| 16 | මො/සේනාපතිය ම.වි. | | | | | | 1 | | 1 | 1 | | | **3** |
| 17 | මො/කැන්දවින්න ම.වි. | | | 1 | | | | | | 1 | | 1 | **3** |
| 18 | මො/අමුණේකදුර ම.වි. | | 1 | | | | | | | 1 | | | **2** |
| 19 | මො/යකුන්නාව ම.වි. | | | | | | 1 | | | | | 1 | **2** |
| 20 | මො/මොනරවාන ක.වි. | | | | | 1 | | | 1 | | | | **2** |
| 21 | මො/පුබ්බාර ක.වි. | | | | | | 1 | | | | | | **1** |
| 22 | මො/බිබිලමුල්ල ක.වි. | | | | | | 1 | | 1 | | | | **2** |
| 23 | මො/රත්තනදෙනිය ක.වි. | 1 | | 1 | | | 1 | | | | | | **3** |
| 24 | මො/ඇල්ලේකෝණ ක.වි. | | | | 1 | | | | 1 | | 1 | | **3** |
| 25 | මො/බකිණිගහවෙල සිං. ක.වි. | | | 1 | | | 1 | | 1 | | | | **3** |
| 26 | මො/තඹාන ක.වි. | | | | | | | 1 | 1 | | | | **2** |
| 27 | මො/කරමැටිය ක.වි. | | | | | | 1 | | 1 | | | | **2** |
| 28 | මො/මඩුල්ල ම.ම.වි. | | | | | | 1 | | | | | | **1** |
| 29 | මො/මාරිඅරාව ම.වි. | | 1 | | | | 1 | | | | | | **2** |
| 30 | මො/ගල්ගමුව ම.වි. | | | | 1 | | 1 | | | | | | **2** |
| 31 | මො/අල්පිටිය ම.වි. | | | | | | 1 | | | | | | **1** |
| 32 | මො/දැලිව ම.වි. | 1 | | | | | | | | | | | **1** |
| 33 | මො/ඩී.එස්.සේනානායක ම.වි. | | | | | | 1 | | 1 | | | | **2** |

# සිංහල මාධ්‍ය ගුරු පුරප්පාඩු - බිබිල අධ්‍යාපන කලාපය

| අනු අංකය | පාසල | විද්‍යාව | ගණිතය | භූගෝල විද්‍යාව | කෘෂි හා ආහාර තාක්ෂණය | බුද්ධාගම | චිත්‍ර | සංගීතය | තොරතුරු තාක්ෂණය | ඉතිහාසය/ දේශපාලන විද්‍යාව | ව්‍යාපාර හා ගිණුම්කරණය | සිංහල | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 34 | මො/නාගහමඩ ම.වි. | | | | 1 | | 1 | | 1 | | | | **3** |
| 35 | මො/කොල්ලදෙනිය ම.වි. | | | 1 | | | | | | | | | **1** |
| 36 | මො/බදුළුවෙල ක.වි. | 1 | | 1 | | | | | 1 | | | | **3** |
| 37 | මො/තම්පලාවෙල ක.වි. | | | 1 | | | | | | 1 | | 1 | **3** |
| 38 | මො/රත්මල්ගහඇල්ල ක.වි. | | | 1 | | | 1 | | | | | | **2** |
| 39 | මො/නීලවබැද්ද ක.වි. | | | | | | | | 1 | | | | **1** |
| 40 | මො/ගල්බොක්ක ක.වි. | | | | 1 | | | | 1 | | | | **2** |
| 41 | මො/කොස්සැල්පොල ක.වි. | | | | | | 1 | | 1 | | | | **2** |
| **එකතුව** | | **4** | **4** | **13** | **5** | **1** | **22** | **1** | **21** | **5** | **1** | **6** | **83** |

# සිංහල මාධ්‍ය ගුරු පුරප්පාඩු - මහියංගණය අධ්‍යාපන කලාපය

| අනු අංකය | පාසල | විද්‍යාව | ගණිතය | භූගෝල විද්‍යාව | බුද්ධ ධර්මය | කෘෂි ආහාර තාක්ෂණ | චිත්‍ර | නැටුම් | සංගීතය | නාට්‍ය හා රංගකලාව | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | ව්‍යාපාර හා ගිණුම්කරණය | සිංහල | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | බ/ මැදඹය කණිෂ්ඨ විද්‍යාලය | | | | | 1 | 1 | | | | | | | **2** |
| 2 | බ/ මැදයාය කණිෂ්ඨ විද්‍යාලය | | | | | 1 | | | | | | | | **1** |
| 3 | බ/දඹගොල්ල කණිෂ්ඨ විද්‍යාලය | | | | | 1 | | | | | 1 | | | **2** |
| 4 | බ/සේරුපිටිය කණිෂ්ඨ විද්‍යාලය | 1 | | | | | | | | | | | | **1** |
| 5 | බ/හද්දත්තාව මහා විද්‍යාලය | | | | | 1 | | | | | 1 | | | **2** |
| 6 | බ/ගිරාදුරුකෝට්ටෙ මහා විද්‍යාලය | 1 | 1 | 1 | | | | | | 1 | | | 1 | **5** |
| 7 | බ/අලුත්තරම කණිෂ්ඨ විද්‍යාලය | | | | | 1 | | | | | | | | **1** |
| 8 | බ/දම්බරාව මහා විද්‍යාලය | | 1 | | | | | 1 | | | 1 | | | **3** |
| 9 | බ/සොරබොරවැව මහා විද්‍යාලය | | | | | 1 | | | | | | | | **1** |
| 10 | බ/හෙබරව මහා විද්‍යාලය | | | | | 1 | | | | | 1 | | | **2** |
| 11 | බ/දඹාන කණිෂ්ඨ විද්‍යාලය | | 1 | | | | 1 | | | | | | | **2** |
| 12 | බ/කුකුලාපොල කණිෂ්ඨ විද්‍යාලය | | | | | 1 | 1 | | | | | | | **2** |
| 13 | බ/වේවත්ත මහා විද්‍යාලය | | | | | 1 | | | | | | | | **1** |
| 14 | බ/රෝහන කණිෂ්ඨ විද්‍යාලය | | 1 | | | | | | | | | | | **1** |
| 15 | බ/රත්කිඳ මහා විද්‍යාලය | 1 | 1 | | | 1 | | | | | | | | **3** |
| 16 | බ/අලුයටවෙල මහා විද්‍යාලය | | 1 | | | | | | | | | | | **1** |
| 17 | බ/ගල්පෝරුයාය කණිෂ්ඨ විද්‍යාලය | | | | | 1 | | | | | | | | **1** |
| 18 | බ/වටවන කණිෂ්ඨ විද්‍යාලය | | 1 | | | | | | 1 | | | | | **2** |
| 19 | බ/උල්හිටිය මහා විද්‍යාලය | 1 | | | | 1 | 1 | | | | | | | **3** |
| 20 | බ/බතලයාය මහා විද්‍යාලය | | | | | | 1 | | | | | | | **1** |
| 21 | බ/රොටලවෙල කණිෂ්ඨ විද්‍යාලය | | | | | | | | 1 | | 1 | 1 | | **3** |
| 22 | බ/බෙගලන්වැව කණිෂ්ඨ විද්‍යාලය | 1 | | | | 1 | | 1 | 1 | | | | | **4** |
| 23 | බ/ගින්නෝරුව කණිෂ්ඨ විද්‍යාලය | | | | | | | 1 | | | | | | **1** |
| 24 | බ/ඇකිරියන්කුඹුර මහා විද්‍යාලය | | 1 | | | | | | | | | | | **1** |
| 25 | බ/පෙතියාගොඩ මහා විද්‍යාලය | | | | | 1 | | | 1 | | | | 1 | **3** |
| 26 | බ/කුරුවිතැන්න මහා විද්‍යාලය | | | | | | | | 1 | | | | | **1** |
| 27 | බ/අරාව මහා විද්‍යාලය | | | 1 | | 1 | 1 | | 1 | | | | | **4** |
| 28 | බ/කන්දේගම මහා විද්‍යාලය | 1 | | | | | 1 | 1 | | | 1 | | | **4** |
| 29 | බ/දෙහිගම මහා විද්‍යාලය | | | | | 1 | 1 | | | | 1 | | | **3** |
| 30 | බ/මහගම මහා විද්‍යාලය | | | | | | | | | | 1 | | | **1** |
| 31 | බ/යල්වෙල මහා විද්‍යාලය | | | | | 1 | | | | | | | | **1** |
| 32 | බ/පින්නගොල්ල කණිෂ්ඨ විද්‍යාලය | | 1 | | | | 1 | | | | | | | **2** |
| 33 | බ/ගැමුණුපුර මහා විද්‍යාලය | | | | | 1 | | | 1 | | | | | **2** |

## සිංහල මාධ්‍ය ගුරු පුරප්පාඩු - මහියංගණය අධ්‍යාපන කලාපය

| අනු අංකය | පාසල | විද්‍යාව | ගණිතය | භූගෝල විද්‍යාව | බුද්ධ ධර්මය | කෘෂි ආහාර තාක්ෂණ | චිත්‍ර | නැටුම් | සංගීතය | නාට්‍ය හා රංගකලාව | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | ව්‍යාපාර හා ගිණුම්කරණය | සිංහල | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 34 | බ/තිස්සපුර මහා විද්‍යාලය | 1 | 1 | 1 | | | | | | 1 | | | | **4** |
| 35 | බ/ඔරුබැදිවැව මධ්‍ය මහා විද්‍යාලය | 1 | 1 | | | | | | | | 1 | | | **3** |
| 36 | බ/අරාවත්ත කණිෂ්ඨ විද්‍යාලය | | | 1 | | | | | | | | | | **1** |
| 37 | බ/කෙසෙල්පොතයාය 12 කණිෂ්ඨ විද්‍යාලය | | | | | | | | | | 1 | | | **1** |
| 38 | බ/කෙසෙල්පොතයාය 11 කණිෂ්ඨ විද්‍යාලය | | | | | | | | 1 | | | | | **1** |
| 39 | බ/ඉකිරියගොඩ කණිෂ්ඨ විද්‍යාලය | | | | | 1 | | | | | | | | **1** |
| 40 | බ/තලාවේගම කණිෂ්ඨ විද්‍යාලය | | | | | 1 | | 1 | | | | | | **2** |
| 41 | බ/මිල්ලැත්තැව මහ විද්‍යාලය | | | | | | 1 | | | | | | | **1** |
| 42 | බ/ බණ්ඩාරනායක මධ්‍ය මහ විද්‍යාලය | 1 | | | | | | | | | | | | **1** |
| **එකතුව** | | **9** | **11** | **4** | **0** | **20** | **10** | **5** | **8** | **2** | **10** | **1** | **2** | **82** |

# සිංහල මාධ්‍ය ගුරු පුරප්පාඩු - මොණරාගල අධ්‍යාපන කලාපය

| අනු අංකය | පාසල | විද්‍යාව | ගණිතය | භූගෝල විද්‍යාව | කෘෂි ආහාර තාක්ෂණය | චිත්‍ර | නැටුම් | සංගීත | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | ව්‍යාපාර හා ගිණුම්කරණය | සිංහල භාෂාව | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | මො/හුලංදාව වම ම.වි. | | 1 | | | | | | 1 | | | **2** |
| 2 | මො/දෙබැද්දේකිවුල ක.වි. | | | | | | | | 1 | | | **1** |
| 3 | මො/බෝහිටිය ක.වි. | | | | | | | | 1 | | 1 | **2** |
| 4 | මො/විද්‍යාලෝක ම.වි. | 1 | 1 | | | 1 | | | | | | **3** |
| 5 | මො/වැලියාය මයුරගිරි ක.වි. | | | | | | | | | 1 | | **1** |
| 6 | මො/තෙනගල්ලන්ද ම.වි. | | 1 | 1 | | 1 | | | | | | **3** |
| 7 | මො/මාගන්දනමුල්ල ක.වි. | | | | | 1 | | | 1 | | | **2** |
| 8 | මො/පඤ්ඤානන්ද ම.වි. | | | 1 | | | | | | | | **1** |
| 9 | මො/කොටිගල්හෙල ක.වි. | | | | | | | | 1 | | | **1** |
| 10 | මො/හිදිකිවුල ක.වි. | | | | | | | | 1 | | | **1** |
| 11 | මො/සුදුවතුරආර ක.වි. | | 1 | | | 1 | | | | | 1 | **3** |
| 12 | මො/ඇතිමලේ ම.වි. | | 1 | | | 1 | | | | 1 | | **3** |
| 13 | මො/දොඹගහවෙල ම.ම.වි. | | 1 | | | | | | 1 | | | **2** |
| 14 | මො/සියඹලාණ්ඩුව ම.වි. | | | | | | | | 1 | 1 | 1 | **3** |
| 15 | මො/ඇතිමලේ 1 පියවර ක.වි. | | | 1 | | | | | 1 | | | **2** |
| 16 | මො/කොටියාගල ක.වි. | | | | | | | | | 1 | | **1** |
| 17 | මො/ගලබැද්ද ම.වි. | | | 1 | | | | | 1 | 1 | | **3** |
| 18 | මො/විලඔය ශ්‍රී පාලි ම.වි. | 1 | 1 | | | | | | | | | **2** |
| 19 | මො/කන්දඋඩපංගුව ම.වි | 1 | 1 | | | 1 | | | | | | **3** |
| 20 | මො/කොඩයාන ක.වි. | | | | | 1 | | | | | | **1** |
| 21 | මො/කෝන්ගස්පිටිය ක.වි. | 1 | | | | | | | 1 | | | **2** |
| 22 | මො/ගලේඅරාව ක.වි. | | | 1 | 1 | | | | | 1 | | **3** |
| 23 | මො/බුද්දම ම.වි. | 1 | | 1 | 1 | | | | | | | **3** |
| 24 | මො/මහකළුගොල්ල ක.වි. | 1 | | | | 1 | | | | 1 | | **3** |
| 25 | මො/මුතුකණ්ඩිය 1 පියවර ක.වි. | | 1 | | | | | | 1 | | | **2** |
| 26 | මො/ගුරුහෙල ක.වි. | | | | | | | | 1 | | | **1** |
| 27 | මො/බඹරගස්රොද ක.වි. | | | 1 | | | | | | | | **1** |
| 28 | මො/රිටිගහවත්ත ක.වි. | 1 | | | | | | | | | | **1** |
| 29 | මො/මීයාගල ක.වි. | | 1 | | | 1 | | | 1 | | | **3** |
| 30 | මො/මුතුකණ්ඩිය 3 පියවර ක.වි. | | | | | | | | | 1 | | **1** |
| 31 | මො/කරානගම ක.වි. | | | | | | | | 1 | | | **1** |
| 32 | මො/ගැමුණුපුර ක.වි. | 1 | | | | 1 | | | | | | **2** |
| 33 | මො/කළුඔබ්බ ක.වි. | | | | | | | | 1 | | | **1** |

# සිංහල මාධ්‍ය ගුරු පුරප්පාඩු - මොණරාගල අධ්‍යාපන කලාපය

| අනු අංකය | පාසල | විද්‍යාව | ගණිතය | භූගෝල විද්‍යාව | කෘෂි ආහාර තාක්ෂණය | චිත්‍ර | නැටුම් | සංගීත | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | ව්‍යාපාර හා ගිණුම්කරණය | සිංහල භාෂාව | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 34 | මො/4 කණුව ම.වි. | 1 | | | | 1 | | | | | 1 | **3** |
| 35 | මො/කොටමුදුන ම.වි. | | | 1 | 1 | | | | 1 | | | **3** |
| 36 | මො/හිඟුරුකඩුව ම.වි. | | | | | 1 | | | 1 | | | **2** |
| 37 | මො/ශ්‍රී ජේමානන්ද ම.වි. | | 1 | | | | | | | 1 | | **2** |
| 38 | මො/කිරවනාගොඩ ක.වි. | | 1 | | | 1 | 1 | | | | | **3** |
| 39 | මො/සිද්ධාර්ත ක.වි. | 1 | | | | | | | 1 | | | **2** |
| 40 | මො/බෝගහපැලැස්ස ක.වි. | | | | | | 1 | | 1 | | | **2** |
| 41 | මො/මඩුගස්මුල්ල ක.වි. | | | | | 1 | | | | | | **1** |
| 42 | මො/මියනකඳුර ම.වි. | | | | 1 | | 1 | 1 | 1 | | | **4** |
| 43 | මො/රනුගල්ල ක.වි. | | | | 1 | | 1 | | 1 | | | **3** |
| 44 | මො/වරාදොල ක.වි. | | | 1 | | | | | | | | **1** |
| 45 | මො/කටුගහගල්ගේ ක.වි. | | | 1 | | | | 1 | | | | **2** |
| 46 | මො/මාලිගාතැන්න ම.වි. | 1 | | | | 1 | | | 1 | | | **3** |
| **එකතුව** | | **11** | **12** | **10** | **5** | **15** | **4** | **2** | **23** | **9** | **4** | **95** |

# සිංහල මාධ්‍ය ගුරු පුරප්පාඩු - පස්සර අධ්‍යාපන කලාපය

| අනු අංකය | පාසල | විද්‍යාව | ගණිතය | භූගෝල විද්‍යාව | කෘෂි හා ආහාර තාක්ෂණය | චිත්‍ර | නැටුම් | සංගීතය | නාට්‍ය හා රංග කලාව | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | මවබස | ඉතිහාසය /දේශපාලන විද්‍යාව | ව්‍යාපාර හා ගිණුම්කරණය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | බ/උඩගම බටහිර මහා විද්‍යාලය | 1 | | | | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | **3** |
| 2 | බ/කහටරුප්ප මහා විද්‍යාලය | 0 | 0 | | 0 | 0 | 0 | 0 | 0 | 0 | | 0 | 1 | **1** |
| 3 | බ/බිබිලේගම මහා විද්‍යාලය | 1 | 1 | | 0 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 1 | **5** |
| 4 | බ/මැදවෙලගම මහා විද්‍යාලය | 0 | 0 | | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | **1** |
| 5 | බ/මැටිගහතැන්න මහා විද්‍යාලය | 0 | 0 | | 0 | 1 | 0 | 1 | 1 | 0 | 0 | 1 | 0 | **4** |
| 6 | බ/ලුණුගල මධ්‍ය මහා විද්‍යාලය | 1 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | **4** |
| 7 | බ/අරවාකුඹුර විද්‍යාලය | 0 | 1 | | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | **3** |
| 8 | බ/ඇකිරිය විද්‍යාලය | 1 | 0 | 1 | 0 | 1 | 1 | 1 | 0 | 0 | 1 | | 0 | **6** |
| 9 | බ/ඉලිපතුතැන්න විද්‍යාලය | 0 | 0 | | 0 | 0 | | 1 | 1 | | 0 | | 1 | **3** |
| 10 | බ/උඩකිරුව විද්‍යාලය | 0 | 0 | | 0 | 1 | | 1 | 0 | 1 | 0 | 1 | 0 | **4** |
| 11 | බ/උඩගම වැල්ගොල්ල විද්‍යාලය | 0 | 0 | 1 | 1 | 1 | 0 | 1 | 0 | 1 | | 0 | 0 | **5** |
| 12 | බ/ගෝනගල විද්‍යාලය | 0 | 0 | | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | **1** |
| 13 | බ/ජයන්ති විද්‍යාලය | 0 | 1 | | | | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | **2** |
| 14 | බ/තොලබෝවත්ත විද්‍යාලය | 0 | 1 | | 0 | 0 | 1 | 0 | 0 | 1 | | 0 | 0 | **3** |
| 15 | බ/නමුණුකුල විද්‍යාලය | 0 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 1 | **7** |
| 16 | බ/පල්ලේකිරුව විද්‍යාලය | | | | | 1 | 1 | | 0 | 1 | 0 | 0 | 0 | **3** |
| 17 | බ/ගැමුණු මහා විද්‍යාලය | 0 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | | 0 | 0 | **2** |
| 18 | බ/පැල්ගහතැන්න විද්‍යාලය | 0 | 0 | | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | **2** |
| 19 | බ/මඩුගස්තලාව විද්‍යාලය | | 1 | | | | | 1 | 0 | 1 | | | 0 | **3** |
| 20 | බ/මාවුස්සාගොල්ල විද්‍යාලය | 0 | 0 | | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | **3** |
| 21 | බ/මිල්ලබැද්ද විද්‍යාලය | 0 | 0 | | 0 | | 0 | 1 | 0 | 0 | 0 | | 1 | **2** |
| 22 | බ/මීරියබැද්ද විද්‍යාලය | 0 | 0 | | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 1 | **3** |
| 23 | බ/ශ්‍රී ධම්මානන්ද විද්‍යාලය | 1 | 0 | 1 | 0 | | 0 | 0 | 0 | 0 | 0 | 0 | | **2** |
| 24 | බ/ජනතාපුර විද්‍යාලය | 1 | 0 | | 0 | | 0 | 1 | 0 | 0 | 1 | 1 | 0 | **4** |
| 25 | බ/වැවබැද්ද විද්‍යාලය | | 0 | | | | 1 | 0 | 0 | 1 | 1 | | 1 | **4** |
| 26 | බ/පුහුල්වත්ත විද්‍යාලය | 0 | 0 | | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | | **1** |
| 27 | බ/මහදෝව සිංහල විද්‍යාලය | 0 | 1 | 1 | 1 | | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 | **5** |
| 28 | බ/ගල්ලුල්ල සිංහල විද්‍යාලය | 0 | 0 | 1 | | | 1 | 0 | 0 | | 0 | | 0 | **2** |
| **එකතුව** | | **6** | **8** | **8** | **4** | **13** | **7** | **10** | **3** | **8** | **3** | **8** | **10** | **88** |

# සිංහල මාධ්‍ය ගුරු පුරප්පාඩු - තණමල්විල අධ්‍යාපන කලාපය

| අනු අංකය | පාසල | විද්‍යාව | ගණිතය | භූගෝල විද්‍යාව | බුද්ධ ධර්මය | කෘෂි ආහාර තාක්ෂණය | නැටුම් | සංගීතය | චිත්‍ර | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | ව්‍යාපාර හා ගිණුම්කරණය | ඉතිහාසය / දේශපාලන විද්‍යාව | සිංහල භාෂාව හා සාහිත්‍යය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | මො/අඟුණකොලපැලැස්ස ම.වි. | | | | | | | | 1 | | | | | **1** |
| 2 | මො/හම්බේගමුව ම.වි. | 1 | 1 | | | 1 | | | 1 | 1 | | | | **5** |
| 3 | මො/කොටවෙහෙරමංකඩ ම.වි. | 1 | 1 | | | | | | | | | | 1 | **3** |
| 4 | මො/හම්බේගමුව ජනපද ක.වි. | 1 | | | | | | | | | | | | **1** |
| 5 | මො/කහකුරුල්ලන්පැලැස්ස ක.වි. | | | | | | | | | | | | 1 | **1** |
| 6 | මො/නාලන්දා ක.වි. | | | | | | | | | | | 1 | | **1** |
| 7 | මො/විජයපුර ක.වි. | | | | | | | | | 1 | | | | **1** |
| 8 | මො/ගලහිනගල විදුහල | | | | | | | | | | | | 1 | **1** |
| 9 | මො/දෙටගමුව ක.වි. | | | 1 | | | 1 | | | | | | | **2** |
| 10 | මො/ගෝතමීගම ක.වි. | | 1 | | | 1 | | | | | | | | **2** |
| 11 | මො/ සෝමාදේවිමහා විදුහල | | | 1 | 1 | | | 1 | 1 | | 1 | | | **5** |
| 12 | මො/හබුරුගල විදුහල | | | | | | 1 | | | | | 1 | 1 | **3** |
| 13 | මො/කීර්තිකුමාරපුර කනිටු විදුහල | | | | | | | | | | | | 1 | **1** |
| 14 | මො/හබරළුවැව මහා විදුහල | 1 | | | 1 | | | | | | | | | **2** |
| 15 | මො/කොවුල්ආර ම.වි. | | 1 | | | | | 1 | | | | 1 | | **3** |
| 16 | මො/සෙවනගල ම.වි. | | 1 | | | | 1 | 1 | | | | | | **3** |
| 17 | මො/ධර්මාලෝක මහා විදුහල | | | 1 | | | | | | | | | 1 | **2** |
| 18 | මො/මහගම මහනාග විදුහල | | | | | | | | | | | 1 | | **1** |
| 19 | මො/කිරි/ බන්ඩාරනායක ම.වි | | | | 1 | 1 | | | | | | | | **2** |
| 20 | මො/අලුත්වැව කනිටු විදුහල | | | | | | | | | 1 | | | | **1** |
| 21 | මො/සෙවනගල උස්බිම් ම.වි. | | | | | | | | | | | | | **0** |
| 22 | මො/කිරිබ්බන්ආර ම.වි. / සඳරාජ ම.වි | | | 1 | | | | | | | | | | **1** |
| 23 | මො/සමගිපුර තරුණ ජනපද ක.වි. | | | | | 1 | | | | | | | 1 | **2** |
| | **එකතුව** | **4** | **5** | **4** | **3** | **4** | **3** | **3** | **3** | **3** | **1** | **4** | **7** | **44** |

# සිංහල මාධ්‍ය ගුරු පුරප්පාඩු - වියළුව අධ්‍යාපන කලාපය

| අනු අංකය | පාසල | විද්‍යාව | ගණිතය | භූගෝල විද්‍යාව | කෘෂි ආහාර තාක්ෂණය | බුද්ධ ධර්මය | චිත්‍ර | නැටුම් | සංගීතය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | ඉතිහාසය/ දේශපාලන විද්‍යාව | ව්‍යාපාර හා ගිණුම්කරණය | සිංහල භාෂාව | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | බ/ සොරණාතොට මධ්‍ය මහා විද්‍යාලය | | | | | | 1 | | | 1 | | 1 | | **3** |
| 2 | බ/ එගොඩවෙල මහා විද්‍යාලය | | | 1 | | | 1 | | | | | | 1 | **3** |
| 3 | බ/ කුට්ටියගොල්ල මහා විද්‍යාලය | | 1 | | | | 1 | 1 | | 1 | | 1 | | **5** |
| 4 | බ/ කොස්ගොල්ල මහා විද්‍යාලය | | | | | | | | | | 1 | | | **1** |
| 5 | බ/ පුස්සැල්ලාකන්ද මහා විද්‍යාලය | 1 | | | | | | | | | 1 | 1 | | **3** |
| 6 | බ/ පුස්සැල්ලාව මහා විද්‍යාලය | | | | | | 1 | | | | | | 1 | **2** |
| 7 | බ/ බුදුගේකන්ද මහා විද්‍යාලය | | | | 1 | | | | 1 | | 1 | | 1 | **4** |
| 8 | බ/ වත්තේකැලේ මහා විද්‍යාලය | | 1 | | | | 1 | | | | | | 1 | **3** |
| 9 | බ/ පිටමාරුව මහා විද්‍යාලය | | | 1 | 1 | 1 | | | | 1 | 1 | | 1 | **6** |
| 10 | බ/ කලුගහකඳුර මහා විද්‍යාලය | | 1 | | 1 | | 1 | | | | 1 | 1 | | **5** |
| 11 | බ/ මොරහෙල මහා විද්‍යාලය | | | | | | 1 | | | 1 | | | 1 | **3** |
| 12 | බ/හුම්හමඩ මහා විදුහල | | | | | | | | | 1 | | | | **1** |
| 13 | බ/ කරඳගහමඩ මහා විද්‍යාලය | | | 1 | | | | | | | | | 1 | **2** |
| 14 | බ/ පොල්ගහඅරාව මහා විද්‍යාලය | | 1 | | | | 1 | | | | 1 | | 1 | **4** |
| 15 | බ/ මහකඳුර මහා විද්‍යාලය | | | | | | | | | | | | 1 | **1** |
| 16 | බ/ සූරියගොල්ල මහා විද්‍යාලය | | | | | | 1 | | | | | | | **1** |
| 17 | බ/ වෙන්දේසියාය මහා විද්‍යාලය | 1 | | 1 | 1 | | 1 | | | | 1 | | | **5** |
| 18 | බ/ ගලඋඩ මහා විද්‍යාලය | | | | | | | | | | 1 | | | **1** |
| 19 | බ/ ගෝඩුන්න මහා විද්‍යාලය | | | | | | | | | | | 1 | | **1** |
| 20 | බ/ වියළුව මහා විද්‍යාලය | | | | | | | 1 | | 1 | | 1 | | **3** |
| 21 | බ/ ලබුගස්තලාව මහා විද්‍යාලය | | | 1 | | | | | | | 1 | | | **2** |
| 22 | බ/ කන්දකැපුඋල්පත මහා විද්‍යාලය | | 1 | | | | 1 | | | 1 | | | | **3** |
| 23 | බ/ කිවුලේගෙදර මො. මහා විද්‍යාලය | | | | | | | | | | 1 | 1 | 1 | **3** |
| 24 | බ/ මහකැලේ මහා විද්‍යාලය | | 1 | | | | | | | | 1 | | 1 | **3** |
| 25 | බ/ මාලියද්ද මහා විද්‍යාලය | | | | | | | 1 | | | 1 | 1 | | **3** |
| 26 | බ/ මුඩගමුව මහා විද්‍යාලය | 1 | | | | | | | | | 1 | | | **2** |
| 27 | බ/ වැල්ලේවෙලතැන්න මහා විද්‍යාලය | | 1 | 1 | | | 1 | | | | 1 | | | **4** |
| 28 | බ/ වැවතැන්න මහා විද්‍යාලය | 1 | 1 | | | | | | | | | | 1 | **3** |
| 29 | බ/ තල්දෙන නවෝද්‍යා මහ විද්‍යාලය | | | 1 | | | | 1 | | | | | | **2** |
| | එකතුව | **4** | **8** | **7** | **4** | **1** | **12** | **4** | **1** | **7** | **14** | **8** | **12** | **82** |

# සිංහල මාධ්‍ය ගුරු පුරප්පාඩු - වැලිමඩ අධ්‍යාපන කලාපය

| අනු අංකය | පාසල | විද්‍යාව | ගණිතය | භූගෝල විද්‍යාව | කෘෂි ආහාර තාක්ෂණය | බුද්ධ ධර්මය | චිත්‍ර | නැටුම් | සංගීත | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | ඉතිහාසය / දේශපාලන විද්‍යාව | ව්‍යාපාර හා ගිණුම්කරණය | සිංහල භාෂාව | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | බ/නැදුන්ගමුව ම වි | | 1 | | | 1 | | | | 1 | | | | **3** |
| 2 | බ/කළුබුලුලන්ද ම වි | | | | | | | | | 1 | | | | **1** |
| 3 | බ/ශ්‍රී රතනජෝති ම වි | | | | | | | | | 1 | | 1 | | **2** |
| 4 | බ/ශ්‍රී පුඤ්ඤසාර වි | | | | | | | | | | 1 | | | **1** |
| 5 | බ/රත්කරව්ව වි | | | | | | 1 | | | | | | | **1** |
| 6 | බ/ශ්‍රී ප්‍රඥාසේන වි | | | | | | | | | 1 | | | | **1** |
| 7 | බ/ධර්මපාල වි | | | | | | | | | 1 | | | | **1** |
| 8 | බ/එරබද්ද වි | | | | | | | | | 1 | | | | **1** |
| 9 | බ/ගම්බැද්ද වි | | | | | 1 | 1 | | | 1 | | | | **3** |
| 10 | බ/හින්නාරංගොල්ල වි | | | | | | 1 | | | | | 1 | | **2** |
| 11 | බ/ශ්‍රී මලියදේව වි | | | | | | | | | 1 | | 1 | | **2** |
| 12 | බ/ලන්දේගම වි | | | | 1 | | 1 | | | 1 | | 1 | | **4** |
| 13 | බ/නාවෙල වැලිමඩ වි | | | | | | | | | 1 | | | | **1** |
| 14 | බ/පිටපොල වි | | | | | | 1 | | | | | | 1 | **2** |
| 15 | බ/උඩුබාදන වි | | | | | 1 | | | | | | | | **1** |
| 16 | බ/විදුරුපොල වි | | | | | | | 1 | | 1 | | | | **2** |
| 17 | බ/වැලිමඩගම වි | | | | | | | | | 1 | | 1 | | **2** |
| 18 | බ/මල්පොත ශ්‍රී මහින්ද වි | | | | | | 1 | | | 1 | | 1 | | **3** |
| 19 | බ/බලතොටඇල්ල වි | | | | | | 1 | | | 1 | | | | **2** |
| 20 | බ/ගම්පහ මස්පන්න ම වි | 1 | 1 | | | | | | 1 | 1 | | | | **4** |
| 21 | බ/තුප්පිටිය ම වි | | 1 | | | | 1 | | | | | | | **2** |
| 22 | බ/වැවේගම ම වි | | | | | | | 1 | | | 1 | 1 | | **3** |
| 23 | බ/සපුගොල්ල ම වි | | | | | | 1 | | | | | | | **1** |
| 24 | බ/බුස්දුල්ල වි | | 1 | | | | | | | 1 | | | | **2** |
| 25 | බ/දිඹුලන වි | | | | | | | 1 | | 1 | | | | **2** |
| 26 | බ/දියබෝකඳුර වි | 1 | | | | | | | | | 1 | | | **2** |
| 27 | බ/මැටිවලලන්ද වි | | | | | | | 1 | | | 1 | | | **2** |
| 28 | බ/පන්නලවෙල වි | | | | | | | | | 1 | 1 | | | **2** |
| 29 | බ/පේරවැල්ල වි | | | 1 | | | | | | | | | 1 | **2** |
| 30 | බ/රහුපොල වි | | | | | | | | | | 1 | | | **1** |
| 31 | බ/තවලම්පොල වි | | | | | | 1 | | | | | | | **1** |
| 32 | බ/උණපාන වි | | | | | | | | | 1 | | | | **1** |
| 33 | බ/උඩපේරුව වි | | | | | | 1 | 1 | | | | | | **2** |

# සිංහල මාධ්‍ය ගුරු පුරප්පාඩු - වැලිමඩ අධ්‍යාපන කලාපය

| අනු අංකය | පාසල | විද්‍යාව | ගණිතය | භූගෝල විද්‍යාව | කෘෂි ආහාර තාක්ෂණය | බුද්ධ ධර්මය | චිත්‍ර | නැටුම් | සංගීත | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | ඉතිහාසය / දේශපාලන විද්‍යාව | ව්‍යාපාර හා ගිණුම්කරණය | සිංහල භාෂාව | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 34 | බ/උඩුහාවර ම වි | | | 1 | | | | | | | | 1 | | **2** |
| 35 | බ/ඌව පරණගම වි | 1 | | | | | | 1 | | | | 1 | | **3** |
| 36 | බ/ජනාධිපති වි | | | | | | | | | 1 | | | | **1** |
| 37 | බ/යාලගමුව වි | | 1 | | | | | | | 1 | 1 | | 1 | **4** |
| 38 | බ/හාගිලිඇල්ල වි | | | | | | 1 | | | 1 | | | | **2** |
| **එකතුව** | | **3** | **5** | **2** | **1** | **3** | **12** | **6** | **1** | **22** | **7** | **9** | **3** | **74** |

# සිංහල මාධ්‍ය ගුරු පුරප්පාඩු - වැල්ලවාය අධ්‍යාපන කලාපය

| අනු අංකය | පාසල | විද්‍යාව | ගණිතය | භූගෝල විද්‍යාව | කෘෂි හා ආහාර තාක්ෂණය | බුද්ධධර්මය | චිත්‍ර | බටහිර සංගීතය | නාට්‍ය හා රංග කලාව | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | මො/මහගොඩයාය ජනාසංඛ ආදර්ශ පාසල | | | | | | 1 | | | 1 | **2** |
| 2 | මො/රත්දෙණිවෙල කණිෂ්ඨ විද්‍යාලය | | | | | | | | | 1 | **1** |
| 3 | මො/ඔක්කම්පිටිය ජනපද කණිෂ්ඨ විද්‍යාලය | 1 | | | | | 1 | | | | **2** |
| 4 | මො/හෙළගම කණිෂ්ඨ විද්‍යාලය | | | | | | | | | 1 | **1** |
| 5 | මො/ඇතාදූටුවැව කණිෂ්ඨ විද්‍යාලය | 1 | | | | | | | | 1 | **2** |
| 6 | මො/මහආරගම කණිෂ්ඨ විද්‍යාලය | | | | 1 | | | | | | **1** |
| 7 | මො/ඩී.එස්. සේනානායක කණිෂ්ඨ විද්‍යාලය | 1 | | | | | | | | | **1** |
| 8 | මො/තෙළුල්ල කණිෂ්ඨ විද්‍යාලය | | | 1 | | | | | | 1 | **2** |
| 9 | මො/බලහරුව කණිෂ්ඨ විද්‍යාලය | | 1 | | | 1 | | | | 1 | **3** |
| 10 | මො/වෙහෙරයාය කණිෂ්ඨ විද්‍යාලය | | | | | | | | | 1 | **1** |
| 11 | මො/කුරුගම කණිෂ්ඨ විද්‍යාලය | | | 1 | | | | | | 1 | **2** |
| 12 | මො/යුදගනාව කණිෂ්ඨ විද්‍යාලය | | | | | | 1 | | | | **1** |
| 13 | මො/උනාවටුන කණිෂ්ඨ විද්‍යාලය | | | | | | | | | 1 | **1** |
| 14 | මො/නියදැල්ල කණිෂ්ඨ විද්‍යාලය | 1 | | | | | | | | | **1** |
| 15 | මො/විහාරමහාදේවී කණිෂ්ඨ විද්‍යාලය | 1 | | | | | | | | | **1** |
| 16 | මො/ආනපල්ලම කණිෂ්ඨ විද්‍යාලය | 1 | | | | | | | | 1 | **2** |
| 17 | මො/හඳපානාගල මහා විද්‍යාලය | | | | | | | | 1 | | **1** |
| 18 | මො/කිතුල්කොටේ මහා විද්‍යාලය | | 1 | 1 | | | | | | | **2** |
| 19 | මො/වෙහෙරයාය මහා විද්‍යාලය | | | | | 1 | 1 | | | 1 | **3** |
| 20 | මො/රන්ජන් විජේරත්න මහා විද්‍යාලය | | | | | | | | | 1 | **1** |
| 21 | මො/ඇතිලිවැව මහා විද්‍යාලය | | | 1 | | | 1 | | | | **2** |
| 22 | මො/පියනන්ද කනිටු විදුහල | | | | | 1 | | | | | **1** |
| 23 | මො/පැල්වත්ත නවෝදා මහා විද්‍යාලය | | | 1 | | | | 1 | | | **2** |
| | **එකතුව** | **6** | **2** | **5** | **1** | **3** | **5** | **1** | **1** | **12** | **36** |